# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2234/49 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා - 2021.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්,

i. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2021 අංක 3 දරන නියෝගවල (මෙහි මින්මතු "2021 අංක 3 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ, ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපලබ්ධි වූ (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) සමීපතම පවුලේ සාමාජිකයෙකුගෙන් මුදල් ත්‍යාග ලෙස විගාමිකයෙකු ලද අරමුදල්වලින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම අත්හිටුවීම.

ii. 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ, මෙම නියමයෙහි දිනය දක්වා, සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

iii. 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

iv. 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ ඕනෑම වර්තන ආදායමක් හෝ සමුච්චිත වර්තන ආදායමක් (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ඕනෑම විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හරහා ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

v. 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

vi. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/37 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2021 අංක 4 දරන නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයකු සඳහා එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

vii. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද, 2021 අංක 1 දරන විදේශ විනිමය නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත (අ) සිට (ඈ) දක්වා අවශ්‍යතාවයන් ඉටු වන බවට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටුවනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩො. 15,000ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා එ.ජ.ඩො. 30,000ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

viii. ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ. එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

ix. 2021 අංක 1 දරන විදේශ විනිමය නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7 (10) වගන්තිය ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07 - 178

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.